සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

**නර්තනය - (දේශීය) I**
நடனம் - (தேசிய) I
Dancing - (Indigenous) I

**52 S I**

*පැය දෙකයි*
*இரண்டு மணித்தியாலம்*
*Two hours*

**විභාග අංකය :** ..........................................

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා**

| පිටු අංකය | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 04 | |
| 02 | 05 - 11 | |
| 03 | 12 - 19 | |
| 04 | 20 - 25 | |
| 05 | 26 - 37 | |
| 06 | 38 - 44 | |
| 07 | 45 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති. ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**උපදෙස්:**

※ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.

- අංක **01** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ ලියන්න.**

**1.** දේශීය නර්තන ශෛලීන් වෙන් කොට හඳුනාගැනීමේ දී භාවිත කළ හැකි මූලික ලක්ෂණ වන්නේ,
(1) මණ්ඩිය, අංගහාර සහ සරඹ අභ්‍යාසයන් ය.
(2) සුරල් පෑගීම, තිත් රූප සහ හස්තපාද හැසිරීම් ය.
(3) තිත් රූප, වන්නම් සහ පැනීම් කැරකීම් ය.
(4) තිත් රූප, පැනීම් කැරකීම් සහ රංග වස්ත්‍රාභරණ ය.
(5) අංගහාර, රංග වස්ත්‍රාභරණ සහ තිත් රූප ය. (.........)

**2.** විභාව හේතුකොට ගෙන ඇතිවන හැඟීම් හඳුන්වනු ලබන්නේ,
(1) ව්‍යාභිචාරී භාව ලෙස ය. (2) අනුභාව ලෙස ය.
(3) ආලම්භන විභාව ලෙස ය. (4) උද්දීපන විභාව ලෙස ය.
(5) ස්ථායී භාව ලෙස ය. (.........)

**3.** රීරි යකාගේ මුහුණ හැඩයෙන් සමාන වන්නේ,
(1) සූකරයෙකුට ය. (2) වලසෙකුට ය.
(3) වානරයෙකුට ය. (4) කිඹුලෙකුට ය.
(5) ගුරුළෙකුට ය. (.........)

**4.** 'හෙළ ගී මගෙහි' දක්වා ඇති පරිදි ප්‍රස්තාරකරණයේ දී විභාගයක් ඇතුළත අන්තර්ගත කළ හැකි උපරිම මාත්‍රා ගණන කීයද?
(1) 2 (2) 3 (3) 4 (4) 5 (5) 6
(.........)

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki



**5.** බෙරයේ හඬ වෙනස් කිරීම සඳහා වඩාත් වැදගත් ශිල්පීය විධික්‍රමය වන්නේ,

(1) බෙරය සමබරව තබාගෙන වාදනය කිරීමයි.
(2) වෙනිවර සහ කොකුවර තද කිරීමයි.
(3) බෙර කඳෙහි පුල්ලෝරම් කැපීමයි.
(4) බෙර ඇසට වැරෙන් සහ සෙමෙන් පහරදීමයි.
(5) බෙර තට්ටුව තද කිරීම සහ බුරුල් කිරීමයි. (.........)


**6.** ශාන්තිකර්මයන්හි දී අංග රචනය සඳහා භාවිත කරන සාම්ප්‍රදායික අමුද්‍රව්‍ය වන්නේ,


(1) පහන් දැලි, එඬරු කිරි සහ කහ කුඩු ය.
(2) පහන් දැලි, එඬරු කිරි සහ අල්ලියාදු කුඩු ය.
(3) පහන් දැලි, කපුරු දැලි සහ පොල් තෙල් ය.
(4) පහන් දැලි, කපුරු දැලි සහ කෙසෙල් කහට ය.
(5) පහන් දැලි, කෙසෙල් කහට සහ පොල් තෙල් ය. (.........)

**7.** "උදුල කළ දිගු නයන දිගු ගෙල පබල හසහර කමල කළ රැළි ..." යනු,

(1) හටන් කවියකි. (2) ප්‍රශස්තියකි.
(3) ටීකාවකි. (4) නළඟන වැනුමකි.
(5) නාරිලතා වැනුමකි. (.........)

**8.** පහත රූප අතුරෙන් සිංහල සැරසිලි කලාව ග්‍රන්ථයේ කතුවරයා තෝරන්න.


ලයනල් බෙන්තරගේ
(1)


ජයසේන කෝට්ටගොඩ
(2)


වෛද්‍යවතී රාජපක්ෂ
(3)


මුදියන්සේ දිසානායක
(4)


චිත්‍රසේන ඩයස්
(5)

(.........)

**9.** අංකෙළි උපත සහ පලවැළ දානය කතා පුවත් හා බැඳී ඇති ශාන්තිකර්මය කුමක් ද?

(1) කිරි මඩුව (2) වලියක් මංගල්‍යය
(3) කඩවර කංකාරිය (4) කොහොඹා යක් කංකාරිය
(5) රිද්දි යාගය (.........)

**10.** කොහොඹා හෑල්ලේ කාව්‍ය සාහිත්‍යය මගින් විස්තර කෙරෙනුයේ,

(1) කොහොඹා දෙවියන්ගේ හැසිරීම් රටාවයි.
(2) මලය රජ තුන් කට්ටුවේ උපතයි.
(3) කුවේණියගේ දිවි දෝෂයයි.
(4) කොහොඹා දෙවියන්ගේ උපත් කතාවයි.
(5) කොහොඹා කංකාරියේ උපත් කතාවයි. (.........)

**11.** කුරුණෑගල යුගයේ භාවිත වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු ඇතුළත් සාහිත්‍යය මූලාශ්‍රය **දෙකක්** වන්නේ,

(1) දීපවංශය සහ දළදා සිරිතයි.
(2) මහාවංශය සහ ථූපවංශයයි.
(3) උම්මග්ග ජාතකය සහ සස ජාතකයයි.
(4) ථූපවංශය සහ උම්මග්ග ජාතකයයි.
(5) මහාවංශය සහ එළුඅත්තනගලු වංශයයි. (.........)

විභාග අංකය : ..................................

12. "රඟෙන දිග අටරියන් පුළුල ද සත් රියන් මැන ඇඳුරු සිටගෙන ..." ආදී වශයෙන් වීදිය සකස් කරන අයුරු කියවෙන්නේ කිනම් ශාන්තිකර්මයේ ද?
(1) කිරි මඩුවේ ය. (2) රිද්දි යාගයේ ය.
(3) වලියක් මංගල්‍යයේ ය. (4) සන්නි යකුමේ ය.
(5) බලි යාගයේ ය. (.........)

13. බලි ශාන්තිකර්මයේ සැරසිලි පිළිබඳ කියැවෙන කවි හැඳින්වෙන්නේ කවර නමකින් ද?
(1) බලි මඩුපුරය කවි (2) හිං හතරේ කවි
(3) ග්‍රහ පන්ති කවි (4) මඩු යාදින්න
(5) මඩු සැරසිලි කවි (.........)

14. කිරි මඩුව ශාන්තිකර්මයේ පූජාවිධි රටාවට ආවේණික අංග ඇතුළත් වරණය කුමක්ද?
(1) ඇත් බන්ධනය - මී බන්ධනය
(2) නුගේ හැල්ල - ආඬිගුරු නැටීම
(3) ආඬිගුරු නැටීම - පේබත් හැල්ල
(4) දළුමුර පිදීම - මුරුතැන් පිදීම
(5) කොහොඹා හැල්ල - මංගර හැල්ල (.........)

15. කථකලි නර්තනයේ 'රාම නාට්ටම්' නිර්මාණය කළා යැයි සැලකෙන්නේ කවුරුන්ද?
(1) ජැමොරින් රජු
(2) අක්බාර් රජු
(3) තාම්පුරන් රජු
(4) චක්කියාර්වරු
(5) නම්බූදරි බ්‍රහ්මන් (.........)

16. භරත නාට්‍යම්හි නෘත්ත සහ නෘත්‍ය ගණයට ගැනෙන ශාස්ත්‍රීය නර්තන අංග පිළිවෙළින්,
(1) අලාරිප්පු සහ තිල්ලානා ය.
(2) වර්ණම් සහ අලාරිප්පු ය.
(3) වර්ණම් සහ තිල්ලානා ය.
(4) ශබ්දම් සහ පදම් ය.
(5) තිල්ලානා සහ ශබ්දම් ය. (.........)

17. බටහිර බැලේ සංගීතය සඳහා පියානෝව සමග භාවිත වෙනත් වාද්‍ය භාණ්ඩ මොනවාද?
(1) වයලීනය, හාර්මෝනියම් සහ ගිටාරය
(2) වයලීනය, චෙලෝව සහ ගිටාරය
(3) චෙලෝව, සන්තූර් සහ ගිටාරය
(4) චෙලෝව, සාරංගි සහ ක්ලැපර්ස්ය
(5) ගිටාරය, ක්ලැපර්ස් සහ ඕබෝය (.........)

18. වර්ෂ 1934 දී රබීන්ද්‍රනාත් තාගෝර්තුමා සමග ශ්‍රී ලංකාවට පැමිණි නර්තන කණ්ඩායම ඉදිරිපත් කළ නෘත්‍ය නාටකය වන්නේ,
(1) ශාප්මෝචන් ය.
(2) ඌර්වසීෂායම් ය.
(3) මනෝහාර බන්ධනම් ය.
(4) ෂද්දන්තදායම් ය.
(5) චිත්‍රාංගදා ය. (.........)

19. ග්‍රීක එළිමහන් රංග පීඨයේ ආකෘතියට අනුව නිර්මාණය කර ඇති ශ්‍රී ලාංකේය රංග භූමිය වන්නේ,
(1) පොළොන්නරුව සරස්වතී මණ්ඩපයයි.
(2) පොළොන්නරුව නිශ්ශංකලතා මණ්ඩපයයි.
(3) කොළඹ ජෝන් ද සිල්වා රඟහලයි.
(4) කොළඹ ටවර්හෝල් එළිමහන් රංග පීඨයයි.
(5) පේරාදෙණිය එදිරිවීර සරච්චන්ද්‍ර රංග පීඨයයි. (.........)


Past Papers Wiki

**20.** කෝලම් නාටකය රඟදක්වන රංග භූමිය සහ එහි ප්‍රධාන සැරසිල්ල හඳුන්වන නම් පිළිවෙළින්,
(1) කෝලම් මඩුව සහ වෙස් අත්තයි.
(2) කෝලම් මඩුව සහ කෝලම් වීදියයි.
(3) තානායම්පොළ සහ කෝලම් වීදියයි.
(4) තානායම්පොළ සහ වෙස් අත්තයි.
(5) කමත සහ පහන් පැලයි. (.........)

**21.** බෙර වාදනයේ දී **තරි, රෝං, රුං** ආදී අක්ෂර හැඳින්වීමට වඩාත් සුදුසු පාරිභාෂික නාමය කුමක්ද?
(1) බීජාක්ෂර (2) ගර්භාක්ෂර
(3) ශුද්ධාක්ෂර (4) මිශ්‍රාක්ෂර
(5) ස්වරාක්ෂර (.........)

**22.** සබරගමු සම්ප්‍රදායට අයත් මුල් මාත්‍රය නර්තනයේ සාම්ප්‍රදායික තිත් රූපය කුමක්ද?
(1) දෙසුළු මහ තුන්තිත
(2) දෙසුළු මැදුම් තුන්තිත
(3) තුන්සුළු දෙමහ පස්තිත
(4) තුන්සුළු දෙමැදුම් පස්තිත
(5) දෙසුළු දෙමැදුම් මහ පස්තිත (.........)

**23.** පහතරට ශාන්තිකර්මයන්හි භාවිත පහත දැක්වෙන රංගෝපකරණ දෙක නිවැරදිව සඳහන් වරණය තෝරන්න.




(1) සේසත සහ සවරම (2) සේසත සහ චාමරය
(3) කුඩය සහ සවරම (4) කොඩිය සහ චාමරය
(5) කොඩිය සහ සවරම (.........)

**24.** බැලේ කෘතියක නාමික අයිතිය හිමිවන්නේ කවරෙකුට ද?
(1) සංගීත රචකයාට ය
(2) රංග රචකයාට ය
(3) ආලෝකකරණ ශිල්පියාට ය
(4) නිෂ්පාදකවරයාට ය
(5) අධ්‍යක්ෂවරයාට ය (.........)

**25.** 21 වන සියවසේ වඩාත් ප්‍රචලිත වූ නර්තන නිර්මාණ දැකිය හැකි ශ්‍රී ලාංකේය චිත්‍රපට වන්නේ,
(1) පත්තිනි, මන්දාරා සහ කුසපබා ය.
(2) යශෝධරා, මන්දාරා සහ පටාචාරා ය.
(3) ප්‍රේම දඩයම, පත්තිනි සහ ප්‍රේමපූජා ය.
(4) කුසපබා, පත්තිනි සහ යශෝධරා ය.
(5) කුසපබා, පත්තිනි සහ නිධානය ය. (.........)

- අංක **26** සිට **35** තෙක් දී ඇති එක් එක් වාක්‍යයේ හිස්තැනට වඩාත් සුදුසු වචන/වචනය යොදන්න.

**26.** කර්ණාටක තාල පද්ධතියෙහි තිශ්‍ර ජාති ඒක තාලය, දේශීය නර්තනයේ භාවිත .......................... තිත හා සමානකම් දක්වයි.

**27.** රුසියාවේ නිෂ්පාදනය වූ හංසවිල බැලේ නිර්මාණයට ............................................ විසින් සංගීතය සපයා ඇත.

**28.** රංගෝපකරණයෙන් ශරීරයේ විවිධ ස්ථානයන්ට ගසමින් චලන ඉදිරිපත් කරන ගැමි නර්තනය .................................... නම් වේ.

**29.** කැලණිය විශ්වවිද්‍යාලයීය සෞන්දර්ය අධ්‍යයන ආයතනය, 2005 වර්ෂයේ සිට ........................................ විශ්වවිද්‍යාලය නමින් ස්ථාපිත විය.

**30.** බලි ශාන්තිකර්මයන්හි දී ග්‍රහයින්ගේ වර්ණ, වාහන, විමාන සහ භෝජන පිළිබඳ ...................... කවි මගින් විස්තර වේ.

**31.** අඹන ලද බලිය නොපෙනෙන ලෙස ආතුරයා ඉදිරියෙන් අල්ලා සිටින සුදු රෙදි කඩ .......................................... නමින් හඳුන්වයි.

**32.** පහන් පැල් සකස් කිරීමේ දී වියන ලද ගොප් අතු අග කෙළවර එකට අල්ලා බැඳීම ....................... නමින් හැඳින්වේ.

**33.** කථක් නර්තනයේ යෙදුණු ශිල්පීන්ට රාජ නර්තක සහ ගායක වශයෙන් තනතුරු හිමි වූයේ ................... රාජ්‍ය සමයේ දී ය.

**34.** රජවරුන් වර්ණනා කරන ලද ප්‍රශස්ති කාව්‍ය රචනා කිරීම ආරම්භ වූයේ ............................. යුගයේ දී යැයි සැලකේ.

**35.** ශ්‍රී ලංකාවේ ප්‍රථම ප්‍රොසීනියම් ආරුක්කු වේදිකාව සහිත රංග ශාලාව ................................ රඟහල ලෙස හැඳින්වේ.

- අංක **36** සිට **50** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **තිත් ඉර** මත ලියන්න.

**36.** පටාචාරා සහ බැරිසිල් මුද්‍රා නාට්‍ය නිර්මාණකරුවන්ගේ නම් ලියන්න.

(i) පටාචාරා :..........................................................................................

(ii) බැරිසිල් :..........................................................................................



A



B

**37.** ඉහත රූප අතුරෙන් A රූපයෙහි දක්වා ඇති දිගු සාය සහ B රූපයෙහි ඉනෙහි සිට වළලුකර දක්වා ඇති රැළි සහිත කොටස නම් කරන්න.

(i) A : ..........................................................

(ii) B : ..........................................................

[හයවැනි පිටුව බලන්න.

**38.** නූතන අංග රචනයේ දී කෘතිම ඇස් පිහාටු සහ ඇස් පිහාටු වර්ණකය හඳුන්වන නම් ලියන්න.

(i) කෘතිම ඇස් පිහාටු : ..............................................................................................

(ii) ඇස් පිහාටු වර්ණකය : ..............................................................................................

**39.** "රූ රුසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා."

ඉහත දැක්වෙන කවි පාදයේ සඳහන් ලඝු හා ගුරු අක්ෂර ගණන ලියා දක්වන්න.

(i) ලඝු අක්ෂර ගණන: ..............................................................................................

(ii) ගුරු අක්ෂර ගණන: ..............................................................................................



A



B

**40.** ඉහත රූප අතුරින් A හා B රංගාභරණ නම් කරන්න.

(i) A සබරගමු - ....................................................

(ii) B උඩරට - ....................................................

**41.** කිරි මඩුව උපත් කතාවට අනුව කිරි වෛරයෙන් සටන් වැදුණු කුමාරයා සහ එම සටනින් මියගිය කුමාරයා කවුද?

(i) සටන් වැදුණු කුමාරයා : ..............................................................................................

(ii) මියගිය කුමාරයා : ..............................................................................................

**42.** වැල්ලවාය සහ මුල්ලේරියාව වැනි සිංහල සටන් අළලා ලියැවුණු හටන් කාව්‍යය කුමක්ද? එහි රචකයා කවුරුන්ද?

(i) හටන් කාව්‍ය : ....................................................

(ii) රචකයා : ....................................................

**43.** "ඇත එපිට දීපංකර මුණි විවරණ ගන්නේ ..."

ඉහත කවිය අයත් ගායනා විශේෂය සහ එය භාවිත ශාන්තිකර්මය කුමක්ද?

(i) ගායනා විශේෂය : ....................................................

(ii) ශාන්තිකර්මය : ....................................................


**44.** බලි ඇදුරාගේ වම් අතෙහි සහ දකුණු අතෙහි දක්නට ලැබෙන රංග භාණ්ඩ මොනවාද?

(i) වම් අතෙහි : ....................................................

(ii) දකුණු අතෙහි : ....................................................

[හත්වැනි පිටුව බලන්න.

**45.** පහත රූපයේ දැක්වෙන සැරසිල්ල සහ එය අයත් ශාන්තිකර්මය කුමක්ද?



(i) සැරසිල්ල : ..............................................................................................

(ii) ශාන්තිකර්මය : ..............................................................................................

**46.** උඩැක්කි උපත් කාව්‍ය සාහිත්‍යයට අනුව ලණුපට සහ සවරම ලබාදුන්නා යැයි සැලකෙන දෙවිවරුන් කවරහුද?

(i) ලණුපට : ..................................................

(ii) සවරම : ..................................................

**47.** තුන්සුළු දෙමහ පස්තිත ප්‍රස්තාරගත කිරීමේ දී භාවිත විභාග ගණන සහ මාත්‍රා ගණන කීයද?

(i) විභාග ගණන : ..................................................

(ii) මාත්‍රා ගණන : ..................................................

**48.** බලි ශාන්තිකර්මයන්හි ඉරු සහ සඳු ග්‍රහයින්ට අයත් වර්ණ **දෙක** නම් කරන්න.

(i) ඉරු : ..................................................

(ii) සඳු : ..................................................

**49.** උඩරට වන්නම් බිහිවීම සඳහා පාදක වූ පැරණි ග්‍රන්ථ **දෙකක්** නම් කරන්න.

(i) ..........................................................................

(ii) ..........................................................................

**50.** මෝල්ගසට පූජනීය වටිනාකමක් දී ඇති ශාන්තිකර්ම ගායනා වර්ග **දෙකක්** නම් කරන්න.

(i) ..........................................................................

(ii) ..........................................................................

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

නර්තනය - (දේශීය) II
நடனம் - (தேசிய) II
Dancing - (Indigenous) II

52 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

- මෙම ප්‍රශ්න පත්‍රය **I, II** හා **III** වශයෙන් කොටස් **තුනකින්** සමන්විත වේ.
- **I** කොටසේ **1** හා **2** ප්‍රශ්න අනිවාර්ය වේ.
- **II** හා **III** කොටස්වලින් **අවම වශයෙන් එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, අනිවාර්ය ප්‍රශ්න **දෙක** ද ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු ය.
- සෑම ප්‍රශ්නයකම **(i)** කොටසට ලකුණු **06**ක් ද **(ii)** කොටසට ලකුණු **06**ක් ද **(iii)** කොටසට ලකුණු **08**ක් ද වශයෙන් මුළු ලකුණු **20**ක් බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) පහත සඳහන් බෙර පද අතුරින් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරා මහ තනිතිතට අනුව සමගුණ සහ දෙගුණ වශයෙන් ප්‍රස්තාර කරන්න.

(අ) තකට තකට කුඳ තකට කුජිං ජිං

(ආ) ගුහිතිගදිරිකිට ගහිතිගදිරි ගුඳ

(ඉ) තක්කඩ ජික්කඩ තොංගඩ නංගඩ

(ii) පහත දැක්වෙන කවි පදය අවග්‍රහයෙන් ආරම්භ කර මැදුම් තනිතිතට ප්‍රස්තාර කරන්න.

"අනේ මී මැස්සේ මල් රොන් ගෙන යන රිස්සේ."

(iii) ඉහත (i) කොටස සඳහා තෝරා ගත් සම්ප්‍රදායට අනුව මයුරා වන්නමේ කස්තිරම හෝ ශුද්ධතාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ නාගගජගා වන්නමේ අඩව්ව හෝ ප්‍රස්තාර කරන්න.

**2.** දේශීය නර්තන කලාව පිළිබඳ තොරතුරු විමසීමේ දී ඓතිහාසික මූලාශ්‍රය වැදගත් වේ.

(i) අනුරාධපුර යුගයේ නර්තන කලාව බෞද්ධාගමික අවස්ථා සඳහා යොදාගෙන ඇති ආකාරය ලිඛිත සාධක **තුනක්** ඇසුරෙන් පිරික්සන්න.

(ii) ගම්පොළ යුගයේ භාවිත තූර්ය භාණ්ඩ පිළිබඳ තොරතුරු එම යුගයේ රචිත සංදේශ කාව්‍යයක් ඇසුරෙන් විස්තර කරන්න.

(iii) මහනුවර යුගයේ, කවිකාර මඩුව හා ඉලංගම් පහ මගින් නර්තන කලාවට සිදු වූ සේවය සාකච්ඡා කරන්න.

PAST PAPERS WIKI

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## II කොටස

**3.** සිංහල ශාන්තිකර්ම යනු ගායනය, වාදනය, නර්තනය, නාට්‍යමය පෙළපාළි සහ චාරිත්‍රවිධි සමෝධානය වූවකි.

(i) කිරිමඩුව ශාන්තිකර්මයෙහි කිරි ඉතිරවීමේ චාරිත්‍රය ගොඩනැගීම සඳහා එහි උපත් කතාවෙන් ලැබෙන පිටිවහල විස්තර කරන්න.

(ii) වලියක් මංගල්‍යයට සහ කොහොඹා යක් කංකාරි ශාන්තිකර්මයට පොදු නාට්‍යමය පෙළපාළි සහ නර්තනාංග **තුන** බැගින් වෙන්කොට ලියා දක්වන්න.

(iii) සන්නියකුම ශාන්තිකර්මයේ බෙර වාදන විශේෂතා කරුණු **හතරක්** ඇසුරෙන් විග්‍රහ කරන්න.

**4.** (i) "ශාන්තිකර්ම ඇදුරා පස්පවින් වැළකුණු තිසි දේහ ලක්ෂණවලින් යුතු අයෙකු විය යුතු ය." බලි ශාන්තිකර්මයේ කාව්‍ය සාහිත්‍ය ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ii) රටයකුම හෙවත් රිද්දි යාගය පැවැත්වීමට පෙර තොවිලය නියම කරගැනීම සඳහා කෙරෙන පූර්ව චාරිත්‍රය **සඳහන් කර** මාතර හා බෙන්තර ශෛලීන් දෙකෙහි වෙනස්කම් පැහැදිලි කරන්න.

(iii) පොත්කඩේ යක්කමෙහි භාවිත සතර අභිනය පිළිබඳ සාකච්ඡා කරන්න.

**5.** (i) සතර බීජාක්ෂර සඳහන් කර එහි උපත, කාව්‍ය සාහිත්‍ය ඇසුරෙන් දක්වන්න.

(ii) ජස චරිතය නිරූපණය කිරීම සඳහා ගායනය සහ නර්තනය උපයෝගී කරගෙන ඇති ආකාරය විස්තර කරන්න.

(iii) ගොයම් සහ අරවිවෙට්ටු යන ගැමි නැටුම් මගින් පිළිබිඹුවන සිංහල හා දෙමළ සංස්කෘතික අනන්‍යතා විමසන්න.

## III කොටස

**6.** පහත සඳහන් වගුවෙහි (අ), (ආ) සහ (ඉ) යන කොටස්වලට අදාළව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| **(අ)** කොටස | **(ආ)** කොටස | **(ඉ)** කොටස |
|---|---|---|
| කාරි | භාග්‍යචන්ද්‍ර | නට්ක්‍රැකර් |
| උප්පනයි | මහා පීටර් | හංසවිල |
| ඩෙප්පු | මහා අක්බාර් | නිදි කුමරිය |
| පච්චා | රාජා කර්තා | ගිසෙල්ලි |

(i) **(අ)** කොටස - භරත නාට්‍යයම් සම්ප්‍රදායට අයත් පාරිභාෂික නාමය තෝරා එය කෙටියෙන් විස්තර කරන්න.

(ii) **(ආ)** කොටස - කථක් නර්තන සම්ප්‍රදාය සඳහා අනුග්‍රහය දැක්වූ රජු තෝරා ඔහුගේ දායකත්වය අගයන්න.

(iii) **(ඉ)** කොටස - ඔඩෙට් චරිතය අයත් බැලේ නාට්‍යය තෝරා එහි ප්‍රධාන සිදුවීම් **තුනක්** විචාරය කරන්න.

**7.** (i) රංග වින්‍යාසයේ දී අවකාශ භාවිතය හා සම්බන්ධ සංකල්ප **තුනක්** විස්තර කරන්න.

(ii) සමස්ත ලංකා පාසල් නර්තන තරග සිසු ශක්‍යතා සංවර්ධනය සඳහා දායක වේද? කරුණු **තුනක්** ඇසුරින් පිරික්සන්න.

(iii) ගායනය සහිත බෙර වාදනයේ දී පහත සඳහන් ශිල්ප ක්‍රමයන්හි වැදගත්කම පහදන්න.

- නිවැරදි අක්ෂර වාදනය
- හඬ පාලනය
- තාල අවබෝධය
- අන්තර් සබඳතා

**8.** (i) ළමා පෞරුෂ සංවර්ධනය සඳහා රියැලිටි නර්තන වැඩසටහන්හි බලපෑම කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න.

(ii) සාම්ප්‍රදායික නර්තනය කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම පහත සඳහන් කරුණු ඇසුරින් විස්තර කරන්න.

- නර්තන අංගහාර
- ඇඳුම් පැළඳුම්

(iii) දේශීය සංස්කෘතියේ පැවැත්ම කෙරෙහි නර්තන කලාව හා බැඳි සාරධර්මයන්හි වැදගත්කම කරුණු **හතරක්** ඇසුරින් අගයන්න.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

* * *

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library